# මහනුවර ශාන්ත පාවුළු දේවස්ථානය පිළිබඳ පුරාවිද්‍යාත්මක අධ්‍යයනය

(වාස්තුවිද්‍යාත්මක හා කලාත්මක අගයන් ඇසුරින්)

පී.ජේ.ඩබ්.එන්. නෝනිස්

පුරාවිද්‍යා හා උරුම කළමනාකරණ අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය
janeenanonis2@gmail.com

**ප්‍රමුඛ පද:** දේවස්ථාන වාස්තුවිද්‍යාව, බ්‍රිතාන්‍ය සමය, වික්ටෝරියානු කලාව

## හැඳින්වීම

ක්‍රි. පූ 3 වැනි සියවස දී ශ්‍රී ලංකාවට මිහිඳු හිමියන් විසින් බුදු දහම රැගෙන එමත් සමඟ, ලක්දිව බෞද්ධාගමික රටක් බවට පත් විය. එහෙත් කාලයක් සමඟ ඇති වූ ආක්‍රමණ හා සංක්‍රමණ හේතුවෙන් විවිධ ආගම් මෙරට තුළ ස්ථාපනය වීම සිදුවිය. යටත්විජිත සමයේ දී ලංකාවට පැමිණි පෘතුගීසි, ලන්දේසි හා ඉංග්‍රීසි ජාතිකයන් විසින් රෝමානු කතෝලික, රෙපරමාදු හා එංගලන්ත සභා යනාදී විවිධ නිකාය ධර්ම යටතේ මූලිකවම ක්‍රිස්තියානි ධර්මය මෙරට තුළ ව්‍යාප්ත කළ අතර, එමගින් දේශීය ජන සමාජයට විශාල බලපෑමක් එල්ල විය. 19 වැනි සියවස තුළ ලංකාවේ පාලන බලය තහවුරු කර ගැනීම මෙරට බ්‍රිතාන්‍ය වර්ධනීය අවධියක් ද සමඟම සුවිශේෂී වූ ආකාරයේ කලාත්මක හා වාස්තුවිද්‍යාත්මක ලක්ෂණ සහිත ආගමික ගොඩනැගිලි නිර්මාණය කිරීම සිදු විය(බස්නායක, 2005). මෙලෙස යටත් විජිත සමයේ ලක්දිව බ්‍රිතාන්‍ය සමාජය පිළිබඳ හා සමස්ථ ලංකා සමාජය පිළිබඳ ක්‍රි. ව 1843 වර්ෂයේදී බ්‍රිතාන්‍ය රජය මඟින් මහනුවර බලකොටුවේ දේවස්ථානය ඉදිකරන ලදි. නිල වශයෙන් එය 15 වැනි හා 37 වැනි රෙජිමේන්තුවල ආගමික කටයුතු සඳහා යොදාගෙන තිබේ. මහනුවර ශාන්ත පාවුළු දේවස්ථානයේ ඇති ඊට සුවිශේෂී වූ කලාත්මක හා වාස්තුවිද්‍යාත්මක අංග ඇසුරින් යටත්විජිත සමයේ ලක්දිව බ්‍රිතාන්‍ය සමාජය හා සමකාලීන දේශීය ජන සමාජයට ඇති වූ බලපෑම පිළිබඳව අධ්‍යයනය කිරීමට මෙහිදී අපේක්ෂිතය.

## ක්‍රමවේදය

ක්ෂේත්‍ර නොවන අධ්‍යයන යටතේ පුස්තකාල ගවේෂණය හා පූර්ව පර්යේෂණ, සැලසුම්, සිතියම් අධ්‍යයනය සිදු කළ අතර ක්ෂේත්‍ර අධ්‍යයන යටතේ නිරීක්ෂණ හා සම්මුඛ සාකච්ඡා සිදු කරන ලදි. හඳුනාගත් දත්ත, වාස්තුවිද්‍යාත්මක හා කලාත්මක අංග ලෙස මූලික වර්ගීකරණයකට ලක් කර විශ්ලේෂණය කළ අතර සමකාලීන සම ආගමික හා අන්‍යාගමික දේවස්ථාන වෙත ද අවධානය යොමු කරමින් සංසන්දනාත්මකව කරුණු ඉදිරිපත් කර ඇත.

## ප්‍රතිඵල හා සාකච්ඡා

අතීත මානව සමාජය වර්තමානය ප්‍රතිනිර්මාණය කරනු ලබන්නේ වාස්තුවිද්‍යාත්මක හා කලාත්මක අංගයන් තුළිනි. 19 වැනි හා 20 වැනි සියවස් යනු ලාංකික වාස්තුවිද්‍යාවේ හා කලාවේ ප්‍රධාන සන්ධිස්ථානයක් ලෙස හඳුන්වාදිය හැකිය. ක්‍රි.ව 1843 දී මහනුවර නගරය කේන්ද්‍රකොට ගනිමින් දළදා මාළිගාවට යාබදව නිර්මාණය කරන ලද ශාන්ත පාවුළු දේවස්ථානය මේ සඳහා නිදසුන්

ලෙස දැක්විය හැකිය.මෙම දේවස්ථානය සමකාලීන බ්‍රිතාන්‍යය තුළ ව්‍යාප්තව පැවති වික්ටෝරියානු වාස්තුවිද්‍යා හා කලා සම්ප්‍රදායට අනුකූලව නිර්මාණය කර තිබේ. මූලික වශයෙන් දේවස්ථාන ගොඩනැගිල්ල කුරුසාකාර හැඩයකින් යුතු වන අතර සමතුලිත සැලස්මකින් යුක්තය. මෙහි පිටත බිත්ති රටාවකට ගඩොල් අතුරා විධිමත් ලෙස නිමවා ඇත. අභ්‍යන්තරය කුළුණුවලින් තොර වන බැවින් උපරිම ඉඩකඩ ප්‍රමාණයක් සලසා ගෙන තිබේ. පොල් අතු රටාව සහිත දැව සිවිලිම සෞන්දර්යාත්මක අගයකින් යුතු වාස්තුවිද්‍යාත්මක අංගයක් ලෙස හඳුන්වාදිය හැකිය. ශාන්ත පාවුළු දේවස්ථානයේ දැකිය හැකි තවත් එක් සුවිශේෂී වාස්තුවිද්‍යාත්මක අංගයක් ලෙස කොටු පවුර සහිත බටහිර කුළුණ පෙන්වා දිය හැකි අතර එහි දිශා තුනක ඔරලෝසු මුහුණත් පිහිටුවා තිබේ. එමෙන්ම මෙය දේවස්ථානයේ ප්‍රධාන අංගයක් වන සීනු කුළුණ ලෙස ද භාවිත කරයි.

මහනුවර ශාන්ත පාවුළු දේවස්ථානය තුළ ඇති කලාත්මක අංග රාශියක් හඳුනාගත හැකිය. ඒ අතරින්,

- රංජිත වීදුරු
- කිරිගරුඬ ඵලක
- දැවමය ගරාදි වැට
- කිරිගරුඬ බෞතීස්ම තටාකය
- පිත්තල බයිබල්
- දැවමය කැටයම් සහිත අල්තාරය

කිහිපයක් ලෙස දැක්විය හැකිය.

සමස්ත වශයෙන් ගත් කළ ශාන්ත පාවුළු දේවස්ථානය යනු කලාත්මක අගයකින් යුතු වාස්තුවිද්‍යාත්මක අංගයකි. මෙමඟින් 19 වැනි හා 20 වැනි සියවස්වල ලක්දිව පැවති බ්‍රිතාන්‍යය සමාජයේ හා සමකාලීන දේශීය ජන සමාජයේ දේශපාලන, ආර්ථික, සමාජීයය තත්ත්වය පිළිබඳ කරුණු රැසක් අනාවරණය වේ. මහනුවර ශාන්ත පාවුළු දේවස්ථානය ස්ථාපනය කිරීමෙහි ලා හුදු ආගමික අරමුණක් පමණක් නොව එවකට පැවති දේශපාලනික තත්ත්වයන් ද බලපෑ බව හඳුනාගත හැකිය. ශ්‍රී ලාංකීක සමාජයේ රාජ්‍යත්වය තහවුරු කිරීම උදෙසා දළදා වහන්සේ ප්‍රමුඛ වේ. මේ හේතුවෙන් උඩරට රාජධානි නගර මධ්‍යයේ පිහිටි දළදා මාළිගාව සමකාලීන දේශීය ජන සමාජය තුළ රාජ්‍යත්වය හොබවන සංකේතයක් ලෙස ගෞරවයට පාත්‍ර විය. ක්‍රි. ව 1796 දී මෙරටට පැමිණෙන ඉංග්‍රීසීන් ක්‍රි.ව 1815 දී උඩරට ඇතුළු සමස්ත ලංකාවම යටත් කර ගත්ත ද දේශීය ජනයා විසින් බ්‍රිතාන්‍යය පාලනය පිළිගැනීමට පසුබට විය. මෙවන් වාතාවරණයක් තුළ බ්‍රිතාන්‍යයන් දේශීය ජනයා ඉදිරියේ තමන්ට හැකි සෑම අවස්ථාවකදීම උපරිම අයුරින් තම පාලන බලය විදහාදැක්වීමට උත්සුක විය. මෙම පර්යේෂණය තුළ සාකච්ඡාවට ලක් කෙරෙන මහනුවර ශාන්ත පාවුළු දේවස්ථානය බ්‍රිතාන්‍යය දේශපාලනික අරමුණු මැනවින් නිරූපණය කරන වාස්තුවිද්‍යාත්මක හා කලාත්මක අංගයක් ලෙස සැලකීම යෝග්‍යය වේ.

දේවස්ථානය තුළ දක්නට ලැබෙන සුවිශේෂී කලාංගයක් වන කිරිගරුඬ ඵලක, ලංකාව තුළදී මරණයට පත් වූ ඉංග්‍රීසි ජාතිකයින්ගේ පවුලේ සාමාජිකයන් විසින් ඔහු සිහිවීම සඳහා ප්‍රදානය කරන ලද සිහිවටන වේ. යටත්විජිත රාශියක පාලන බලය හා ආර්ථික බලය හිමිව තිබූ බ්‍රිතාන්‍යයේ සමකාලීන පවුල් ආර්ථිකයේ වර්ධනීය හා ශක්තිමත්භාවය මෙමගින් මනාව පිළිබිඹු වේ. 19 වැනි හා 20 වැනි සියවස්වල දී තම පාලන බලය හා ආර්ථික බලය ලංකාව තුළ තහවුරු කර ගත් බ්‍රිතාන්‍යයන් තම පවුල් සාමාජිකයන් ද මෙරටට ගෙන්වා ගැනීම සිදුවිය. එහිදී ලංකාව තුළ බ්‍රිතාන්‍යය සමාජයේ වර්ධනීය අවධියක් උදා වූ අතර ඔවුන්ගේ සිරිත් විරිත්, ගතිපැවතුම් ආදී ආභාෂයන් සමකාලීන දේශීය ජන සමාජයට

විසරණය විය. දේවස්ථානය තුළ ඇති කිරිගරුඬ ඵලක අතර සිංහල අක්ෂර සහිත සිංහලයන්ට අයත් ඵලක දක්නට ලැබීමෙන් එය සාධනය වේ.

මේ අනුව මහනුවර ශාන්ත පාවුළු දේවස්ථානය යනු යටත්විජිත සමයේ ලක්දිව බ්‍රිතාන්‍ය සමාජය හා සමකාලීන දේශීය ජන සමාජයට ඇති වූ බලපෑම පිළිබඳව තොරතුරු රැසක් අනාවරණය කරන, සාහිත්‍යමය මූලාශ්‍ර පුරාවිද්‍යාත්මකව සාධනය කරන සුවිශේෂී කලාත්මක අගයක් සහිත වාස්තුවිද්‍යාත්මක අංගයක් ලෙස හඳුනාගත හැකිය.

**ආශ්‍රිත ග්‍රන්ථ:**


බස්නායක, එච්.ටී. (2005)***ශ්‍රී ලංකාවේ ශිෂ්ටාචාරය-03.***කොළඹ: ඇස් ගොඩගේ සහ සහෝදරයෝ.

ලෙවිස්, එෆ්. (2007)***ලංකාවේ හැට හතර වසරක්.*** පරාක්‍රම ඇස් විජේවර්ධන.කොළඹ: ඇස් ගොඩගේ සහ සහෝදරයෝ.